# වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල

## (කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම)

**(1)** තනතුරු නාමය :- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (පුරප්පාඩු - 02)

**(2)** අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

<u>බාහිර අයදුම්කරුවන්</u>

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේ දී උපාධිය,

සමඟ

ඉහත ක්ෂේත්‍රයකට අදාලව වසර (02) කට නොඅඩු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම,

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අට (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධිය,

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ හෝ පිළිගත් පෞද්ගලික අධ්‍යයන හා පුහුණු ආයතනයක ඉගැන්වීම, පුහුණුව, උපදේශනය පිළිබඳ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම"

<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**II.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධිය,

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ වසර (02) කට නොඅඩු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

"අධ්‍යයන/ පර්යේෂණ" සේවා ගණයන්හි (AR-1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**III.** "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍ය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් ප්‍රථම උපාධිය,

සමඟ

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම,

සහ

අධ්‍යයන/පර්යේෂණ සේවා ගණයෙහි (AR-1) තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(3)** වයස

අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි අය විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(4)** වැටුප් ක්‍රමය

බඳවාගනු ලබන පදනම අනුව AR 2 -2025 වැටුප් කේතය පදනම් කරගෙන කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප ගෙවනු ලැබේ

**(5)** තනතුරට පැවරෙන කාර්යයන්

- ❖ අදාල විෂය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි මෙහෙයවනු ලබන අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීම, මෙහෙයවීම, නියාමනය, දේශන පැවැත්වීම හා ඉගෙනුම් ක්‍රමවේද සැළසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- ❖ විෂයමාලා සංවර්ධනය කිරීම, ඒ සඳහා මඟපෙන්වීම, ආයතනික පාඨමාලාවල සහ වැඩසටහන්වල විෂය නිර්දේශ සංස්කරණය කිරීම.
- ❖ ආයතනික පාඨමාලාවල සහ අනුමත පුහුණු වැඩසටහන්වල විභාග ශාලාධිපති ලෙස කටයුතු කිරීම, විභාග ප්‍රශ්ණ පත්‍ර සැකසීම, විභාග ප්‍රශණ පත්‍ර ප්‍රමිතිගතව සංස්කරණය (Moderate) කිරීම, පිළිතුරු පත්‍ර,නිබන්ධන ඉදිරිපත් කිරීම (Presentation) ඇගයීම,පිළිතුරු පත්‍ර නැවත පරීක්ෂා (Re-correction) කිරීම.
- ❖ සමුපකාර ව්‍යවසායන්හි කළමනාකරණ සංවර්ධනයට අදාල වැඩසටහන් මෙහෙයවීම හා කළමනාකරණ උපදේශක සේවා සැපයීම.
- ❖ කළමනාකරණ ක්ෂේත්‍රයේ නව පර්යේෂණ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- ❖ වෘත්තීය කළමනාකරණ සංවර්ධනයට අදාල සියලු දෑ ඉටුකිරීම හා අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) වෙත නිර්දේශ සැපයීම.
- ❖ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ජාතික සමුපකාර සංවර්ධන ආයතනයට අනුබද්ධව පිහිටවනු ලබන මධ්‍යස්ථානයක සේවය කිරීමට හා බැහැර ප්‍රදේශයන්හි පුහුණු පාඨමාලා පැවත්වීමේදී අදාල රාජකාරි ඉටු කිරීම.
- ❖ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) ගේ උපදෙස් හා නියෝග මත අදාල රාජකාරි අංශයේ ඵලදායිතාවය හා ප්‍රවර්ධනය ඇතිවන ලෙස කටයුතු කිරීම.

**(7).** **බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට තෝරා ගනු ලැබේ.

**(8).** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු ලබා දීමේ ක්‍රමය**

| | | | |
|---|---|---|---|
| I | අධ්‍යාපන සුදුසුකම්(මූලික සුදුසුකම්වලට අතිරේකව) | - ලකුණු | 30 |
| II | පර්යේෂණ පළපුරුද්ද | - ලකුණු | 10 |
| III | ප්‍රකාශන,පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදානයන් | - ලකුණු | 20 |
| IV | විෂය බාහිර ක්‍රියාකාරකම් | - ලකුණු | 10 |
| V | පෞරුෂත්වය | - ලකුණු | 15 |
| VI | අදාල ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | - ලකුණු | 15 |
| | | **ලකුණු** | **100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල